# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

EDB SRI LANKA

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# යෝජනා සඳහා ආරාධනය (IFP)

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) විසින් සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකා එක්ස්පෝ 2027 (Sri Lanka Expo 2027) සඳහා වෘත්තීය නිර්මාණකරණය සහ මුද්‍රණ සේවා ආයතනයක් සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයුම් ආයතනයක් තෝරා පත්කර ගැනීමේ ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් අංකය : EDB/PU/NCB/2026/03**

01. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB), 2027 ජනවාරි 14 සිට 17 දක්වා "Sri Lanka Expo - 2027" ජාත්‍යන්තර ප්‍රදර්ශනය පැවැත්වීමට සැලසුම් කර ඇත.

02. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) මගින් සංවිධානය කරනු ලබන "Sri Lanka Expo - 2027" සඳහා සුදුසුකම්ලත් වෘත්තීය නිර්මාණකරණය සහ මුද්‍රණ ආයතන සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයුම් ආයතන වෙතින් මුද්‍රා තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ.

03. සුදුසුකම් ලත් ලංසුකරුවන්ට නිර්මාණකරණය සහ මුද්‍රණය කිරීම සහ / හෝ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයුම් කොන්ත්‍රාත්තු සඳහා යෝජනා ඉදිරිපත් කළ හැක.

04. 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB – තනි අදියර ද්විත්ව කවර ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය) ක්‍රමවේදය හරහා ලංසු තැබීම සිදු කරනු ලබන අතර, මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා එය විවෘත වේ.

05. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු, අසාදු ලේඛනගත කර නොතිබිය යුතුය. සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායක සඳහා පහත කරුණු ඇතුළත් විය යුතුය. (අතිරේක සුදුසුකම් අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත)

| | සුදුසුකම් නිර්ණායක | නිර්මාණකරණය කිරීම සහ මුද්‍රණය කිරීම | ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම |
|---|---|---|---|
| අ) | සාමාන්‍ය පළපුරුද්ද | සේවා සැපයුම්කරුට මහා පරිමාණ ජාත්‍යන්තර හෝ ජාතික ප්‍රදර්ශන, වෙළඳ ප්‍රදර්ශන, සම්මන්ත්‍රණවල නිර්මාණකරණය සහ මුද්‍රණ සේවාවල අනිවාර්යෙන් අවම වශයෙන් වසර 05 (පහ) ක තහවුරු කළ පළපුරුද්දක් තිබිය යුතුය. | සේවා සැපයුම්කරුට සමාන සේවා සැපයීම සම්බන්ධයෙන් අනිවාර්යෙන් අවම වශයෙන් වසර 05 (පහ) ක තහවුරු කළ පළපුරුද්දක් තිබිය යුතුය. |
| ආ) | සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තු 02 (දෙක)ක නිශ්චිත පළපුරුද්ද | පසුගිය වසර 05 (පහ) තුළ අවම වශයෙන් සමාන ස්වභාවයේ මහා පරිමාණ නිර්මාණකරණය සහ මුද්‍රණ කොන්ත්‍රාත්තු 02 (දෙක)ක සහ එක් එක් කොන්ත්‍රාත්තුවක වටිනාකම රුපියල් මිලියන 02 (දෙක) කට නොඅඩු විය යුතුය. | පසුගිය වසර 05 (පහ) තුළ අවම වශයෙන් කොන්ත්‍රාත්තු 02 (දෙක)ක සහ එක් එක් කොන්ත්‍රාත්තුවක වටිනාකම රුපියල් මිලියන 02 (දෙක) කට නොඅඩු විය යුතුය. |
| ඇ) | සාමාන්‍ය පිරිවැටුම | පසුගිය වසර 03 (තුන) තුළ අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 12 (දොළහ) ක් විය යුතුය. | පසුගිය වසර 03 (තුන) තුළ අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 12 (දොළහ) ක් විය යුතුය. |
| ඈ) | ද්‍රවශීලී වත්කම් පැවතීම | සේවා සැපයුම්කරු ශ්‍රී ලංකා රුපියල් මිලියන 03 (තුන) කට නොඅඩු ප්‍රමාණයක් පෙන්විය යුතුය. | සේවා සැපයුම්කරු ශ්‍රී ලංකා රුපියල් මිලියන 03 (තුන) කට නොඅඩු ප්‍රමාණයක් පෙන්විය යුතුය. |

06. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට සහකාර අධ්‍යක්ෂ – ප්‍රසම්පාදන ඒකකය, 06 වන මහල, NDB-EDB කුළුණ, අංක 42, නවම් මාවත, කොළඹ 02, දුරකථන : 011-2300702, විද්‍යුත් තැපෑල : disna@edb.gov.lk වෙතින් වැඩිදුර තොරතුරු ලබාගත හැක.

07. අදාළ ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් පසු උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට SLEDB (6 වන ඡේදයේ සඳහන් ලිපිනය) වෙතින් ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ ප්‍රසම්පාදන ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. එක් ප්‍රසම්පාදන ක්‍රියාකාරකමක් සඳහා ශ්‍රී ලංකා රුපියල් 3,500 (තුන් දහස් පන්සියයක ආපසු නොගෙවන ගාස්තුවක් අදාළ වේ. නිර්මාණකරණය සහ මුද්‍රණය සඳහා – ශ්‍රී ලංකා රුපියල් 3,500 (තුන් දහස් පන්සියයක්) සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම සඳහා ශ්‍රී ලංකා රුපියල් රු. 3500 (තුන්දහස් පන්සියයක්) වේ. මේ දෙකම සඳහා අයදුම් කරන ලංසුකරුවන් විසින් මුළු ආපසු නොගෙවන ගාස්තුව ලෙස ශ්‍රී ලංකා රුපියල් 7,000 (හත් දහසක්) ගෙවියයුතුය. ප්‍රසම්පාදන ලේඛන SLEDB වෙබ් අඩවියේ "Announcement" (නිවේදන) අංශය යටතේ ඇති https://www.srilankabusiness.com/announcements වෙතින් (පරිශීලනය සඳහා පමණක්) බාගත කර ගත හැක. ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇති ක්‍රමයට අනුව ගෙවීම් සිදු කළ යුතු අතර, අදාළ ගෙවීම් පත්‍රිකාවේ (පත්‍රිකාවල) හෝ රිසිට්පතේ (රිසිට්පත්වල) පිටපත් යෝජනාවට අමුණා තිබිය යුතුය. අදාළ ක්‍රියාකාරකම හෝ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ගෙවීම් පිළිබඳ සාක්ෂි නොමැතිව ඉදිරිපත් කරන යෝජනා, ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.

08. යෝජනාවල මුල් පිටපත වෙන වෙනම කවරවල බහාලිය යුතු අතර. (නිර්මාණකරණය සහ මුද්‍රණය කිරීම සඳහා සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම සඳහා) පිටත කවරයේ ඉහළ වම් කෙළවරේ පහත පරිදි සලකුණු කළ යුතුය.

- **EDB/PU/NCB/2026/03 - " Sri Lanka Expo - 2027 සඳහා වෘත්තීය නිර්මාණකරණය සහ මුද්‍රණ සේවා ආයතනයක් සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයුම් ආයතනයක් තෝරා පත්කර ගැනීමේ ප්‍රසම්පාදනය - නිර්මාණකරණය සහ මුද්‍රණ සේවා"** සඳහා වන ලංසුව
- **EDB/PU/NCB/2026/03 - " Sri Lanka Expo - 2027 සඳහා වෘත්තීය නිර්මාණකරණය සහ මුද්‍රණ සේවා ආයතනයක් සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයුම් ආයතනයක් තෝරා පත්කර ගැනීමේ ප්‍රසම්පාදනය - ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම"** සඳහා වන යෝජනාවේ සහ ඉදිරිපත් කරන ආයතනයේ නම කවරයේ සඳහන් විය යුතුය. (ලංසු දත්ත පත්‍රිකාව 8.2 බලන්න)

09. 2026 ජූනි 23 වන දින පෙරවරු 11.00 ට හෝ ඊට පෙර (ඉහත 6 වන ඡේදයේ ඇති ලිපිනය වෙත) වෙන වෙනම (නිර්මාණකරණය සහ මුද්‍රණය සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම සඳහා) යෝජනා භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. යෝජනා භාරගැනීම අවසන් වූ වහාම 2026 ජූනි 23 වන දින පෙරවරු 11.00 ට එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ. යෝජනා වලංගු කාලය දින 91 කි. (2026-09-08)

සියලුම යෝජනා සමග බැංකු ඇපකරයක් ආකාරයෙන් යෝජනා සුරක්ෂණයක් තිබිය යුතු අතර, පහත වගුව මගින් එක් එක් පද්ධතිය සඳහා වන ලංසු සුරක්ෂණයේ වටිනාකම දක්වයි.

| කොන්ත්‍රාත්තුව | යෝජනා සුරක්ෂණය | |
|---|---|---|
| | අකුරෙන් | ඉලක්කමෙන් (ශ්‍රී ලංකා රුපියල්) |
| 01. නිර්මාණකරණය කිරීම සහ මුද්‍රණය | ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂ පනස් දහසක් | 150,000.00 |
| 02 ප්‍රවර්ධන ද්‍රව්‍ය සැපයීම | ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂ පනස් දහසක් | 150,000.00 |

10. පූර්ව යෝජනා රැස්වීමක් 2026 ජූනි 16 වන දින පෙරවරු 10.00 ට EDB හි 9 වන මහලේ VIP කාමරයේදී පැවැත්වේ. සියලුම උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පූර්ව යෝජනා රැස්වීමට සහභාගි විය හැක.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB),**
**අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**2026 ජූනි 09**